# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

# ஸ்ரீலங்கா சீமெந்துக் கூட்டுத்தாபனம

# SRI LANKA CEMENT CORPORATION

වාර්ෂික වාර්තාවහා ගිණුම්

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள

**ANNUAL REPORT AND ACCOUNTS**

**2021**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**වාර්ෂික වාර්තාවහා ගිණුම්**

**2021**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27,වොක්ෂෝල්මන්දිරය,
වොක්ෂෝල්පාර,
කොළඹ - 02.

2022.08

ලේකම්තුමා,
කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලුපාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

**<u>2021වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව</u>**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2021 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2021වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තූතියි.

මෙයට විශ්වාසී,
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

අත්සන් කලේ,
**ගාමිණී ඒකනායක ,**
**සභාපති**
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**අන්තර්ගතය** **පිටු අංකය**


| | | |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 01-04 |
| 02 | සංස්ථාව පිළිබඳ තොරතුරු | 05 |
| 03 | ආයතනික තොරතුරු-2021 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය | 06 |
| 04 | මානව සම්පත් පිළිබඳ තොරතුරු | 07 |
| 05 | සභාපතිතුමාගේ වාර්තාව | 08 |
| 06 | ආයතනික තොරතුරු -ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව | 09 |
| 07 | විගණන කමිටුවේ වාර්තාව - 2021 | 10 |
| 08 | විගණකාධිපතිවිසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2021 | 11-19 |
| 09 | 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 20 |
| 10 | 2021.12.31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් හා රඳවා ගත් ඉපැයුම් ප්‍රකාශනය | 21 |
| 11 | 2021.12.31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය | 22 |
| 12 | 2021.12.31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 23 |
| 13 | 2021.12.31න් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති පැහැදිලි කිරීමේ සටහන් | 24-32 |
| 14 | විස්තරාත්මක විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයසහ උපලේඛණ | 33-35 |
| 15 | 2021වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන් | 36-37 |
| 16 | 2021වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම් | 38-39 |
| 17 | 2017-2020දක්වා වසර 4ක් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 40 |
| 18 | 2017-2020දක්වා වසර 4ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 41 |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
## 2021වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

### 1.0 පසුබිම
1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19දරණරාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතයටතේ 1959 ජනවාරි 01දාසිටලංකාසිමෙන්තිසංයුක්තමණ්ඩලයනමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව"ලෙසසංශෝධනයකරනලදි.

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වනදිනසිටපළාත්පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි19වනදිනසිට2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්තසංවර්ධනඅමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. ඉන් අනතුරුව කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ක්‍රියාත්මක වේ.

### 2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

**දැක්ම**
"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

**මෙහෙවර**
"ගුණාත්මකභවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

**ප්‍රධාන ක්‍රියාකාරකම්**
1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දැ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලදී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය. මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2016 පෙබරවාරි 25සිටශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

## 3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමියමේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් නිදහස් කරගැනීමටත් නැවත එහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමටත් කිහිපවිටකදීම උත්සාහ කලද එය නිෂ්පල විය. එසේම, ආරක්ෂක අංශයන්ගේන් මෙම ඉඩම් නිදහස් කරගැනීමෙන් අනතුරුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම ඇතුලත් වාර්තා සකස් කර ආදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින්හඳුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි.

**(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :**

අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර “කන්කේසන්” වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි.
2008වර්ෂයේ සිට 2012 සංස්ථාව විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 219,559ක් ආනයනය කර ඇත.

2017 වර්ෂයේදී සිමෙන්ති මෙට්‍රික් ටොන් 980ක්පමණක් ආනයනය කර අතර සිමෙන්ති අලෙවි කිරීම සඳහා පළපුරුදු සේවකයින් නොමැති වීම සහ මුල්‍යමය අපහසුතා මත සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

**සිමෙන්ති අලෙවිය**

| වර්ෂය | 2018-2021 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|
| ප්‍රමාණය(මෙට්‍රික් ටොන්) | - | 980 | 4,002 | 2,780 |
| **වටිනාකම (රු.මිලියන)** | - | 12.66 | 60.15 | 37.87 |

(ආ) **කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :**

කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රුහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රුහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009වර්ෂයේ සිට 2012වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන2,003ක්, 1,674 ක් සිදු කර ඇත.2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත.එසේම,2016වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වු කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

**කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනඅලෙවිය**

| වර්ෂය | 2020-2021 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|
| කොන්ක්‍රීට් කණු | - | - | - | - | 304 | - |
| වැටවල් සඳහා වු කණු | - | - | - | 4 | 253 | 391 |
| ආර්.සී.කණු | - | 114 | 99 | 145 | 169 | 419 |
| කොන්ක්‍රීට් ගල් | - | - | - | - | 46,907 | 54,805 |
| **වටිනාකම (රු.මිලියන)** | **-** | **0.57** | **0.56** | **1.13** | **4.07** | **2.69** |

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වු ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 02 දෙදෙනෙකුහැර අනෙකුත් සේවකයින් 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

**(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වත්කම්වලින් උපයන ලද කුලී ආදායම්**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හුණුගල් අවශ්‍ය පුද්ගලයන් සොයා එම ඉඩම් කල්බදු පදනම මත ලබා දී හා එළඹී තිබෙන ගිවිසුම් යාවත්කාලීන කර ඉන් ආදායම් ඉපයා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.

**(ඈ) ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිළිබද මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :**

සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් සංස්ථාව ස්ථායී හා කාර්‍යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හදුනාගෙන ඊට අදාළ කටයුතු සිදු වෙමින් පවතී.එසේම, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලංකා සිමෙන්ති සමාගම සමග ඒකාබද්ධ කිරීමට කටයුතු සිදු වේ. 2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වු අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

## 4.0 ලාභදායීත්වය

සංස්ථාවට 2011 දී රුපියල් මිලියන 2.6 ක ලාභයක් තිබුණි. 2012, 2013 සහ 2014 දී සංස්ථාව පිළිවෙළින් මිලියන 75 ක්, 424 ක් සහ මිලියන 13 ක් ලෙස අඛණ්ඩව පාඩු ලබා ඇත. ඉන්පසුව, සංස්ථාවට අතිරික්තයක් තිබූ අතර 2019 සහ 2020 අවසන් වර්ෂවල බදු ගෙවීමෙන් පසු ලාභය ලෙස පිළිවෙලින් රුපියල් මිලියන 39.35 සහ මිලියන 39.40 ක අතිරික්තයක් තිබුණි.

2021 මූලා ප්‍රකාශනවලට අනුව, රුපියල් මිලියන 44.67 ක ආදායම් බද්දට පෙර ගිණුම් ලාභය උපයා ගත්තෙමු. එය පෙර වසරට සාපේක්ෂව 10% ක වර්ධනයක් පෙන්නුම් කරයි. අනෙකුත් ගිණුම් ගැලපීම් සමඟසංස්ථාව 2021 වර්ෂය සඳහා ශුද්ධ ලාභය ලෙස රුපියල් මිලියන 19.35ක් වාර්තා කර ඇත

## 5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු සතු එකම කර්මාන්ත ශාලාව වන කන්කසන්තුරේ කම්හල 1990 ජුනි මස සිට තාවකාලිකව වසා දැමීම හේතුවෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව දැනට සිමෙන්ති නිෂ්පාදනයේ නිරත නොවේ. වර්තමාන සන්දර්භය සමඟ, "සෞභාග්‍යයේ දැක්ම" යන මගපෙන්වීම සමඟින් කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය විවෘත කිරීමේ තත්ත්වය නිර්මාණය වී ඇත.

නව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පැරණි කර්මාන්තශාලා ගොඩනැගිලි සහ යල් පැන ගිය උපකරණ කඩා ඉවත් කළ යුතුය. එහි ලේඛනගත කිරීම සහ සැලසුම් කිරීමේ කොටසරේඛීය අමාත්‍යාංශ මැදිහත්වීම මත සිදුවෙමින් පවතී

විශේෂඥ අදහස් සහ නිර්දේශයන්ට අනුව, පළමු පියවර ලෙස සිමෙන්ති ඇසුරුම් කම්හල ස්ථාපිත කිරිම සඳහා වැඩි අවස්ථාවක් සහ ශක්‍යතාවක් පැවරෙනු ඇත. ආරම්භයක් ලෙස, ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික අධ්‍යයනය සහ අලෙවිකරණ විශ්ලේෂණය (ප්‍රදේශයේ සිමෙන්ති අවශ්‍යතාවය, භාණ්ඩ අවශ්‍යතා සහ ව්‍යාපෘතිය සඳහා සහාය) සිදු කරනු ලැබේ. මේ වන විට ඇසුරුම් කම්හල ස්ථාපනය කිරීමේ ආයෝජනය රුපියල් මිලියන 73.2ක් ලෙස හඳුනාගෙන ඇත..

තවදසාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අපි අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර සාධාරණ සහ දැරිය හැකි මිලකට බෙදාහැරීම සඳහා කටයුතු කරමු.

## 6.0 සේවය ඇගයීම

2021වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය බැංකුවලහා අනෙකුත් රජයේ ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම,ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවපිළිබඳ තොරතුරු

<u>ප්‍රධාන කාර්යාලය</u>

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො.27,
වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ 02.

දුරකථන අංක: 011-2440201 , 0112440203

ෆැක්ස් අංක: 0112 448 866

<u>පරිපාලිත සමාගම - ප්‍රධාන කාර්යාලය</u>

ලංකා සිමෙන්ති සමාගම,
නො.27,
වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ 02.

දුරකථන අංක: 0112 447 746, 0112 399 243

**<u>සිමෙන්ති කර්මාන්තශාලාව</u>**
කන්කේසන් සිමෙන්ති කර්මාන්තශාලාව,
කන්කසන්තුරේ.

<u>බැංකුකරුවෝ</u>
ලංකා බැංකුව

මහජන බැංකුව

*<u>විගණකවරු</u>*
ජාතික විගණන කාර්යාලය

.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**අධ්‍යක්ෂ මණ්ඩලය:**

| | | |
|---|---|---|
| 01. ගාමිණී ඒකනායක මහතා | සභාපති | - 01.01.2020 දින පත්කර ඇත |
| 02. ටී.ඒ.එස් සුරංග මහතා | අධ්‍යක්ෂ | -01.01.2020දින පත්කර ඇත |
| 03 ජී.එල් චමින්ද ජයලාල් මහතා | අධ්‍යක්ෂ | - 01.01.2020දින පත්කර ඇත |
| 04. යූ.එල් ආර් සෙනරත් පෙරේරා මහතා | අධ්‍යක්ෂ | - 02.06.2020දින පත්කර ඇත |
| 05 එස්.පී ලොකුහැන්නදිගේ මහතා | අධ්‍යක්ෂ | - 26.02.2020දින පත්කර ඇත |
| 06. ඩබ්.ආර් පරණගම මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත | - 16.12.2020දින පත්කර ඇත |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2021.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

| ඛාණ්ඩය | මධ්‍ය කළමණාකරන | කණිෂ්ඨ කළමණාකරන | කළමණාකරන සහකාර | ප්‍රථමික මට්ටම | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 01 | 01 | 03 | 06 | 11 |
| කොන්ක්‍රීට් අංගනය | - | - | - | - | - |
| **එකතුව** | **01** | **01** | **03** | **06** | **11** |

## සභාපතිතුමාගේ පණිවිඩය

2020 ජනවාරි මස 01 දින සිට මා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති ලෙස පත් වූ අතර එම වසරේ මාර්තු මාසයේ ආරම්භ වූ කොවිඩ් 19 වසංගතය නෙසළකා එම වර්ෂය (2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්) ගත කල අතර අද දක්වා මිල කල නොහැකි අප විසින් ළගාකර ඇති දේ පිළිබඳ මා අඩම්බර වෙමි.

සැළකිය යුතු ජයග්‍රහණ කිහිපයක් පහතින් දක්වා ඇත.:

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු අරුවක්කාලුහි පිහිටි ඉඩමෙන් කොටසක් විනාශ කර ආක්‍රමණය කළ අතර අනාගතයේදී සිදුවන විනාශයන් වැළක්වීම සඳහා පියවර ගන්නා ලදී.

පවතින ක්‍රමය අනුව කොල්ලුපිටියේ පිහිටි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ඉඩම වඩා ඵලදායි ලෙස ආදායම් ඉපයීම සඳහා ප්‍රතිව්‍යුහගතකරණය කර ඇත.

මෙම අවස්ථාවේදී,මම ඉතාමත් ආඩම්බරයෙන් සඳහන් කිරිමට කැමතියි අතීතයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව කීර්තිමත් තත්වයකට ගෙන ඒම සඳහා සහාය ලබා දුන් ප්‍රවීණයන්ගෙන සැදුම් ලත් කණ්ඩායම නැවත වරක් සිමෙන්ති නිෂ්පාදනය කිරිම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත.අප විසින් කන්කසන්තුරේ සිමෙන්ති කම්හල වෙත නිරීක්ෂන චාරිකා කිහිපයක් සිදු කර මේ සඳහා දැනට පවතින යන්ත්‍රසූත්‍ර ,කම්හල් සහ ගොඩනැඟිලි,තොග ලබා ගැනිම සම්බන්ධයෙන් පුළුල් වාර්තාවක් සම්පූර්න කර ඇත.

දැනට පවතින ගොඩනැගිලි සහ සිවිල් ව්‍යුහයන්ගෙන් 80%ක් ප්‍රතිසංස්කරණය කර සිමෙන්ති කම්හල සඳහා භාවිත කළ හැකි බව වාර්තාව අනාවරණය කරයි. නමුත් හානියට පත් ගොඩනැගිලි සහ සිවිල් ව්‍යුහයන්ගෙන් 20% ක් කඩා ඉවත් කළ යුතුය. K.K.S සිමෙන්ති කම්හලේ වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරි කටයුතු සඳහා ගරු අමාත්‍යතුමා වෙත භාර දෙන ලදී.

නිෂ්පාදනය, ආනයනය, අලෙවි කිරීම සහ පරිසරය සුරැකීම මෙන්ම දැරිය හැකි මිල පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වකරුවන් අනුගත විය යුතු උපාය මාර්ගයක් සැකසීමට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව මූලිකත්වය ගත යුතුය.

තවද, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන වන ගඩොල්, ආවරණ ද්‍රව්‍ය, උළු වැනි දෑ සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරමින් අඩු වරප්‍රසාද ලත් සමාජය, විශේෂයෙන් ගම් මට්ටම් සවිබල ගැන්වීමේ උපාය මාර්ගයක් නිර්මාණය කර සැලසුම් කළ යුතුය. ඒ හා සමානව, මෙය මැටි සහ අනෙකුත් ආකලන දක්වා ව්‍යාප්ත කල හැක.

දැනට ශ්‍රී ලංකාවේ (පුත්තලම බලාගාරය) පවතින්නේ එක් ඒකාබද්ධ බලාගාරයක් පමණක් වන අතර කන්කසන්තුරේ හෝ හුණුගල් තීරය ආසන්නයේ තවත් සම්පූර්ණ ඒකාබද්ධ බලාගාරයක් විවෘත කිරීමෙන් ක්ලින්කර් ආනයනය විශාල ප්‍රමාණයක් රටට පහසු වන අතර එමගින් රටට විශාල විදේශ විනිමයක් ඉතිරි වේ. භූ විද්‍යා සමීක්ෂණයට අනුව, හුණුගල් (ක්ලින්කර් නිෂ්පාදනය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වේ) තීරය කන්කසන්තුරේ සිට පුත්තලම දක්වා පිහිටා ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හට අහිමි වූ ප්‍රසිද්ධිය නැවත ලබාගෙන ප්‍රමුඛයා ලෙස නැවත පැමිණ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය, ක්ලින්කර් සහ සිමෙන්ති ආනයනය, සැපයුම සහ ඉල්ලුම සහ නිෂ්පාදනයේ සියලු අංශවල එකම අධිකාරිය බවට පත්විය යුතු යැයි මම තරයේ විශ්වාස කරමි.

**දුෂ්කරතා වර්ධනයේ නව දොරටු විවර කරන බව කීම වැරදි නැත. ඔබට නව්‍ය මොළයක් ඇති විට, කිසිදු අවස්ථාවක් මග හැරීම ගැන ඔබ කරදර නොවන්න. අනාගතය කුමක් වුවත්, ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමටත්, වටිනාකම් සහිත නිර්මාණශීලී සංස්ථාවක් බවට පත්වීමේ අරමුණින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සීමාවෙන් ඔබ්බට ගෙන ඉදිරියට යාමටත් මම උත්සාහ කරමි.**

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ ඒවා ඉටු කර ගැනීමට අප වෙත නොමසුරුව සහය ලබා දුන් ගරු කර්මාන්ත අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට තුති පුදන්නට මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි.

පසුගිය මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථා කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කාර්ය මණ්ඩලයට ද මාගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි.

***අත්සන් කළේ,***
**ගාමිණී ඒකනායක(නීතිඥ),**
**සභාපති.**
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**ජ්‍යෙෂ්ඨ කලමණාකරන කමිටුව**

| | | |
|---|---|---|
| 01. එම්.ජී.ඒ.ටී ආර් ජයතිලක මිය | ගණකාධිකාරි | ප්‍රධාන ශාඛාව |
| 02. ර්.එස් චාන්දනී මිය | පරිපාලන නිලධාරි | ප්‍රධාන ශාඛාව |

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**විගණන කමිටු වාර්තාව**

සංස්ථාවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු කමිටුවේ නිරීක්ෂකයින් විය.

දැනට, කමිටුවේ සභාපතිවරයෙකු ලෙස පත් කර ඇති ඩබ්ලිව්.ආර්.පරණගම මහතාගේ සමාලෝචනයට ලක්වන කමිටුවේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනා යූ.එල්.ආර්. සෙනරත් පෙරේරා හා ටී.ඒ.එස්.එස්. සිල්වා යන අධ්‍යක්ෂක වරුන් වේ.

**විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය සහ වගකීම්වලට ඇතුළත් වන්නේ,**

අ) මූල්‍ය වාර්තාකරණයට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට සහ අනෙකුත් අදාළ නීතිමය අවශ්‍යතාවලට අනුකූලව සිදු කරන බව සහතික කිරීම සඳහා අධීක්‍ෂණය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට සහාය වීම

ආ) රජය විසින් නිකුත් කරන ලද සියලුම අදාළ නීති රීති සහ චක්‍රලේඛ අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම, අනුකූල නොවීම පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සමඟ අනුකූල වන බව සහතික කිරීමට මණ්ඩලයට සහාය වීම.

ඇ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ සමාලෝචනය කිරීම සහ ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උදව් කිරීම.

ඈ) ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂමණ්ඩලයට සහාය වීම.

සමාලෝචිත මුදල් වර්ෂය තුළ විගණන කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

• විගණනය නොකළ මාසික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.

විගණනය වූ වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.

• විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ කළමනාකාරිත්වය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.

• ව්‍යවස්ථාපිත වාර්තාකරණය සහ ගෙවීම් අවශ්‍යතා සමඟ අනුකූල වීම පිළිබඳ වාර්තා සමාලෝචනය කිරීම.

**අත්සන් කළේ,**

**ඩබ්ලිව්.ආර්.පරණගම,**
**සභාපති.**
**විගණන කමිටුව**

මගේ අංකය
எனது இல.
My No. IMT/B/SLCC/100/2021/FS

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 17 දින

සභාපති
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත උපකරණ අයිතමයන්හි ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු. 4,463,964 ක් වූ වාහන 02 ක් ඓතිහාසික පිරිවැයට ගිණුම්වල දක්වා තිබුණු අතර වත්කම්වල ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ තුල ඇතුලත් වත්කම් වර්ග 3කට අදාලව ගිණුම්ගත කර ඇති එකතු වටිනාකම් රු.10,113,706ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු.6,518,682ක් වීමෙන් රු.3,595,024ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී වර්ෂය තුල ගෙවා නොමැති රු.10,724,585ක් වූ ආදායම් බදු වියදම වර්ෂයේ ගෙවීම් ලෙස සටහන් කර තිබුණ අතර වෙළඳ හා වෙනත් ලැබීම් වැඩි වීම රු.20,202,989ක් වුවත් රු.5,727,328ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) රු.33,779,005ක් වන මුළු ණයගැති ශේෂයෙන් රු.1,688,950ක වෙන් කිරීමක් පමණක් සිදුකර තිබුණද රු.25,925,739ක හඳුනාගත නොහැකි ණයගැති ශේෂයෙන් කිසිදු වෙන් කිරීමක් කර නොතිබුණි. රු.7,853,266ක ශේෂය තහවුරු කර ගැනීම සඳහා ණයගැති ශේෂ සනාථ ලිපි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) වසර ගණනාවක සිට පැවත එන රු.24,518240ක් වූ ගෙවිය යුතු ශේෂ තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(ඊ) සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා සිමෙන්ති සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(උ) රු.238,256ක් වූ අවසන් තොගය සහ රු.807,440,987ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. සණ මීටර් 25750ක් වූ හුණුගල් තොගයෙහි වටිනාකම ගණනය කොට මූල්‍ය ප්‍රකාශ වලට දක්වා නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරවමා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරනලදී.

  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන

සැකසීමෙන්,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා

විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ),(ආ),2.3 (ඈ),(ඈ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයටයොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 135 | ගණන්දීමේ නිලධාරියා විසින් තමාගේ කාර්යය පොදුවේ හෝ එක් එක් ගණුදෙනු සම්බන්ධයෙන් සංස්ථාවේ සංවිධාන ව්‍යුහය අනුව බලතල පැවරීමක් සිදුකළ යුතු නමුත් සංස්ථාව විසින් 2021 වර්ෂය සඳහා බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා හා මු.රෙ 371 (2) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකි වුවද සංස්ථාවේ ගණන් දීමේ නිලධාරියා විසින්ම රු.660,000ක තත්කාර්යය අතුරු අග්‍රිම අවස්ථා 8 කදී ලබාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3 වෙනත් කරුණු

-------------------

(අ) 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මඟපෙන්වීම සහ නායකත්වය ලබාදීම වන අතර මෙහෙවර වශයෙන් රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක සිමෙන්ති සහ අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම වේ. නමුත් වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිඳු නිෂ්පාදනයක් සිදුකරනු නොලබයි. 2018 වර්ෂයට පෙර සිට සිමෙන්ති විකිණීමෙන් හා කොන්ක්‍රීට් කණු විකිණීමෙන් ආදායම් උපයාගෙන ඇතත් 2018, 2019, 2020 හා 2021 වර්ෂයන් තුල නිෂ්පාදන මගින් කිසිඳු ආදායමක් උපයා ගැනීමට නොහැකි වී ඇත. සංස්ථාවේ ආදායම් මාර්ග සංස්ථාව සතු අක්කර 5164ක් වූ අරුවක්කාලු හුණු ගල් නිධිය බදුදීම, පලාවි පිහිටි අක්කර 12ක් රූඩ් 3 පර්චස් 30ක් වූ ඉඩම බදුදීම හා කොල්ලුපිටිය පිහිටි පර්චස් 89.07ක් වූ ඉඩම රථගාලක් පවත්වාගෙන යාමෙන් ආදායම් ඉපයීම පමණක් වේ. 2021 වර්ෂයේ එම ආදායම රු 65,256,215ක් වී තිබුණි. නමුත් සංස්ථාවට අනුයුක්ත නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඉහත කාර්යය ඉටු කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා ඇතුළුව පරිපාලන වියදම් වශයෙන් රු.19,983,648ක වියදමක් වාර්ෂිකව වැයකරනු ලබයි. එම වියදම මුළු බදු කුලී ආදායමෙන් සියයට 31ක් පමණ වන බව නිරීක්ෂණය විය.

(ආ) 2021 වර්ෂයේ දී බදු පෙර සමස්ත අතිරික්තය රු.44,642,491ක් ලබාගෙන තිබුණි. එසේම වර්ෂයේදී රු 58,000,000ක මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වශයෙන් රු.6,709,944ක් ගෙවිය යුතු වුවත් 2022 අප්‍රේල් දක්වා එම ආදායම් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ පර්චස් 89.07ක් වූ කොල්ලුපිටිය ඉඩම 2008 වර්ෂයේ දී ලංකා බැංකුවේ උකස් කර ලබාගෙන තිබූ ණය මුදල 2017 වර්ෂයේ දී රු.97,700,000කට ප්‍රතිව්‍යුහගත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.58,700,000ක් වේ. ලබාගත් මෙම ණය මුදල වෙනුවෙන් 2021 වර්ෂයේ රු 5,511,774 ක පොලී මුදලක් ගෙවා ඇතත්, එකී ඉඩම බදු දීමෙන් වර්ෂයේ ලද කුලී ආදායම රු.4,893,331 පමණක් වී තිබුණි. රු.මිලියන 735ක් පමණ වටිනා ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් මෙම ඉඩම, 2021 සැප්තැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මිශ්‍ර ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් කිරීම අවසන් කර නොතිබුණි. ඒ අනුව මෙම දේපළ ඵලදායී ආයෝජනයක් සඳහා යොදා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඈ) සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි දෙක හා නළ පද්ධති ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබූ බැවින් 2010 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මේ සඳහා බදු කුලී ආදායම වූ රු.184,680,000ක මුදලක් අයකර ගැනීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇත.

(ඉ) ඉහළ වටිනාකමක් සහිත බර ඛනිජ ද්‍රව්‍ය සහිත අරුවක්කාලු හුණුගල් නිධිය සහිත ඉඩමේ ඉහළ පස් තට්ටුව හා කැණීම් කිරීම සඳහා ලංකා ඛනිජ වැලි සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් 2021 සිට 2025 කාල සීමාව තුළ ආරම්භ කිරීමටත්, ඒ සඳහා අදාල පාර්ශව සමඟ ගිවිසුම් සකස් කිරීම 2020 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා වූ වසර 1 ½ ක කාලයක් තුළ සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද, මෙම වාර්තාවේ දින දක්වාම එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) රටතුල පැවති යුද්ධය නිසා නිෂ්පාදන කටයුතු නවතා දැමූ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාවේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමට අංක අමප/21/0175/320/004 හා 2021 පෙබරවාරි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් තීරණය කර තිබුණි. ඊට සමගාමීව අංක PFD/PMD/01/CM/2021/041 හා 2021 පෙබරවාරි 08

දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කර්මාන්තශාලාවේ සුන්බුන් යකඩ හා ලෝහ පිළිබඳ අයිතම ලැයිස්තු සකස් කර, ඉවත් කළ හැකි ගොඩනැගිලි ආකෘති, යන්ත්‍ර හා සුන්බුන් ලෝහ වල වටිනාකම තීරණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබුණි. එහෙත් එම කාර්යයන් මේ දක්වා සම්පූර්න කර නොතිබුණි. යුද්ධය නිමා කොට වසර 13 ක් ගතවී ඇතත් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කොට සංස්ථාව සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගෙන දේශීය ආර්ථිකයට දායකත්වයක් ලබාදීමට මේ දක්වා සංස්ථාවට නොහැකිවී ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ව ප්‍රකාශනය

**2021 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **03** | 798,772,382 | 797,608,301 |
| විකිණීම සඳහා තබා ඇති වත්කම් | **04** | 750,000 | 750,000 |
| දිගුකාලීනව ලැබිය යුතු දෑ | **05** | - | - |
| වෙනත්ආයෝජනයන් | **06** | 631,383.389 | 631,071,607 |
| | | **1,430,905,771** | **1,429,429,908** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | **07** | 238,256 | 238,256 |
| වෙළඳහාඅනෙකුත්ලැබිය යුතු දෑ | **08** | 53,814,296 | 74,017,285 |
| මුදල් හා මුදල් සමාන දෑ | **09** | 98.560,600 | 63,521,348 |
| | | **152,613,152** | **137,776,889** |
| **මුළු වත්කම්** | | **1,583,518,923** | **1,567,206,797** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 966,971,845 | 966,971,845 |
| පොදුසංචිත | | 9,996,952 | 9,996,952 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 738,702,984 | 738,702,984 |
| රඳවාගත් ඉපැයුම් | | (257,133,449) | (276,879,869) |
| විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත | | (465,956,132) | (465,956,132) |
| **මුළු හිමිකම** | | **992,582,200** | **972,835,780** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොලී ගෙවිය යුතු දිගුකාලීන වගකීම් | **10** | 48,700,000 | 58,700,000 |
| දිගුකාලීනව ගෙවිය යුතු දෑ | **12** | 492,426,190 | 492,426,190 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | **13** | 4,746,445 | 5.519,302 |
| | | **545,872,635** | **556,645,492** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | **14** | 34,545,736 | 28.274,104 |
| පොලීගෙවියයුතු කෙටිකාලීනවගකීම් | **10** | 10,000,000 | 9,000,000 |
| උපචිත බැංකු ණය පොලී | **11** | 518,352 | 451.421 |
| | | **45,064.088** | **37,725,525** |
| **මුළු වගකීම්** | | **590,936,723** | **594,371,017** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,583,518,923** | **1,567,206,797** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 24 සිට 32 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් අදාළ වේ.

*අත්සන් කලේ,*

**එම්.ජී.ජ්.ටී.ආර්.ජයතිලක - ගණකාධිකාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

***අත්සන් කළේ***

| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ | සභාපති |
|---|---|---|
| ජී.එල් චමින්ද ජයලාල් | යූ.එල් ආර් සෙනරත් පෙරේරා | ගාමිණී ඒකනායක |

2022පෙබරවාරි මස 24 වන දින

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**විස්තීරණ ආදායම් හා රදවා ගත් ඉපැයුම් ප්‍රකාශනය**
2021දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම් | **15** | 65,256.215 | 62,305.693 |
| විකුණුම් පිරිවැය | **උපලේඛන. I** | - | - |
| **දළ ලාභය /(අලාභය)** | | **65,256,215** | **62,305,69** |
| වෙනත් ආදායම් | **16** | 4,888,718 | 4,730,156 |
| බෙදාහැරීම්වියදම් | **උපලේඛන.II** | (7,020) | - |
| පරිපාලන වියදම් | **උපලේඛන. III** | (19,983,648) | (18.861,766) |
| මූල්‍ය වියදම් | **17** | (5,511,774) | (7,455,517) |
| **බදු පෙර ලාභය** | **18** | **44,642,491** | **40.718,566** |
| බදු පිරිවැය | | (10,724,585) | (1,302,335) |
| **වර්ෂයට අදාළ ලාභය** | | **33,917,906** | **39,416,231** |
| වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) | **19** | (14,316,639) | - |
| මුළු විස්තීරණ ආදායම්/(වියදම්) | | **19,601,267** | **39,416,231** |
| වර්ෂ ආරම්භයේ රදවාගත් ඉපැයුම් | | (276,879,869) | (138,864,840) |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | **20** | 145,153 | (177,431,260) |
| වර්ෂ අවසානය රදවාගත් ඉපැයුම් | | **(257,133,449)** | **(276,879,869)** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 24 සිට 32 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් අදාළ වේ.

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
## 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | **2020.01.01** දිනට ශේෂය | **2020** වර්ෂයට අදාළ | පූර්ව වර්ෂ ගැලපීම් | ශේෂය **2020.12.31** දිනට | **2021 (2021)** | පූර්ව වර්ෂ ගැලපීම් | ශේෂය **2021.12.31** |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 966,971,845 | - | - | 966,971,845 | - | - | 966,971,845 |
| ප්‍රත්‍යාගණිත සංචිත | 738,702,984 | - | - | 738,702,984 | - | - | 738,702,984 |
| පොදු සංචිත | 9,996,952 | - | - | 9,996,952 | - | - | 9,996,952 |
| රඳවාගත් ඉපැයුම් | (138,864,840) | 39,416,231 | (177,431,260) | (276,879,869) | 19,601,267 | 145,153 | (257,133,449) |
| විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත | (465,956,132) | - | - | (465,956,132) | - | - | (465,956,132) |
| **Total** | **1,110,850,809** | **39,416,231** | **(177,431,260)** | **972,835,780** | **19,601,267** | **145,153** | **992,582,200** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 24 සිට 32 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් අදාළ වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
**2021 දෙසැම්බර්31දිනෙන්අවසන් වර්ෂය සඳහා**

| | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින්ජනිතවුමුදල්ප්‍රවාහයන්** | | | |
| වර්ෂයට අදාළ බදු පෙර ලාභය | | 44,642,491 | 40,701,557 |
| **මුදල්මය නොවූ ආදායම්/(වියදම්) ගැලපීම :** | | | |
| දේපල,පිරියත හා උපකරණවල ක්ෂය වෙන්කිරීම් | 3 | 118,493 | 169,865 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 13 | 430,663 | 861,733 |
| බැංකු ණය පොලී | 17 | 5,511,774 | 7,452,517 |
| මූල්‍යමය නොවූ පූර්ව වර්ෂ ගැලපීම | 21 | - | 584,030 |
| තැම්පත්වලට අදාළ පොළී | 16 | (4,380,682) | (4,192,841) |
| භාණ්ඩාගාර බිල්පත්වලට පොළී | 16 | (336,508) | (423,924) |
| වියදම් සඳහා වෙන්කිරීම | D | 216,351 | - |
| | | **46,202,582** | **45,152,937** |
| **මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වූ වෙනස්කම්** | | | |
| තොගයේ සිදු වූ අඩුවීම්/(වැඩිවීම්) | | - | - |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැහි වූ අඩුවීම්/(වැඩිවීම්) | | 5,727,328 | 2,845,348 |
| <u>ගෙවිය යුතු බැංකු ණය පොළීහි වූ වැඩිවීම් /( අඩුවීම්)</u> | | 66,931 | (259,471) |
| <u>වෙළඳහාඅනෙකුත්ගෙවියයුතුදැහිවූවැඩිවීම් /(අඩුවීම්)</u> | | 6,271,632 | (159,609) |
| | | **58,268,473** | **47,579,205** |
| **අඩුකිරීම් :** | | | |
| පාරිතෝෂිත ගෙවීම් | | (1,040,170) | - |
| පොළී ගෙවීම් | | (5,444,843) | (7,761,054) |
| බදු ගෙවීම් | | (10,724,585) | (1,302,335) |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින්ජනිතවූ ශුද්ධමුදල්ප්‍රවාහයන්** | | **41,058,875** | **38,515,816** |
| **ආයෝජනක්‍රියාකාරකම්වලින්ජනිතවූ මුදල්ප්‍රවාහයන්** | | | |
| කෙටිකාලීන තැම්පතුවල ආයෝජනය කිරීම් | | (58,000,000) | (51,500,000) |
| කෙටිකාලීන තැම්පතු මුදල් කර ගැනීම් | | 29,825,620 | 18,503,582 |
| වත්කම් මිලදී ගැනීම් | | (1,252,574) | (46,610) |
| **ආයෝජනක්‍රියාකාරකම්වලින්ජනිතවූ ශුද්ධමුදල්ප්‍රවාහයන්** | | **(29,426,954)** | **(33,043,028)** |
| **මූල්‍යක්‍රියාකාරකම්වලින්ජනිතවුමුදල්ප්‍රවාහයන්** | | | |
| ණය හා අනෙකුත් ණය පහසුකම් පියවීම් | | (9,000,000) | (6,000,000) |
| **මූල්‍යක්‍රියාකාරකම්වලින්ජනිතවූ ශුද්ධමුදල්ප්‍රවාහයන්** | | **(9,000,000)** | **(6,000,000)** |
| **වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දැහි** | | 2,631,921 | (527,212) |
| **මුදල් හා මුදල් සමාන දැහිවර්ෂ ආරම්භක ශේෂය** | | 6,153,589 | 6,680,801 |
| බැංකුගත මුදල්හි වර්ෂ අවසාන ශේෂය | | 8,785,510 | 6,153,589 |
| කෙටිකාලීන මුදල් තැම්පතු | | 89,775,089 | 57,367,759 |
| **මුදල් හා මුදල් සමාන දැහිවර්ෂ අවසාන ශේෂය** | | **98,560,599** | **63,521,348** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 24 සිට 32 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් අදාළ වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්**
**2021දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

## 1.සාමාන්‍ය තොරතුරු

1950වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19දරණරාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතයටතේ 1959 ජනවාරි 01දාසිටලංකාසිමෙන්තිසංයුක්තමණ්ඩලයනමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව"ලෙසසංශෝධනයකරනලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත,කොළඹ 03 යනස්ථානයේපිහිටාඇත. වර්තමානයේමෙහිප්‍රධාන කාර්‍යයන් ලෙස සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන නිපද වීම හා අලෙවිය සිදු කරනු ලබයි.
ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

## 2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සදහන් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සඳහන් වේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

### 2.1.මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත අතර එය ආසන්න රුපියලට වටයා ඇත.

### 2.1.1.දිගුකාලීන පැවැත්ම

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු අතර ආයතනය ඈවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

### 2.2.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්

### 2.2.1.පරිපාලිතයන්

1981වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.
2017 වසරේ එක් කොටසක වෙළෙඳපොළ වටිනාකම රුපියල් 5.70 ක් වූ අතර කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් හෙළිදරව් කරන ලද තොරතුරුවලට අනුව දැනට මෙම කොටස් වෙළඳාමේ නොමැත.
ලංකා සිමෙන්ති සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය කර්මාන්ත අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුවෙමින් පවතී.

### 2.2.2.ආශ්‍රීතයන්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම සමාගමේ නම 2016 සැප්තැම්බර් 15 වන දින සිට මහවැලි මෙරියන් සිමෙන්ති (පුද්ගලික) සමාගම ලෙස වෙනස් කරන ලදී.

ආශ්‍රිතයන්ගේ ආයෝජන විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස ගණන් ගැනේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල අලාභ හානි හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම් සංචිතයේ එකතු වී ඇති පාඩු කොටස් ලාභයට හෝ අලාභයට නැවත වර්ග කිරීමෙනි.

ආශ්‍රිත ආයෝජනවලින් ලැබෙන ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ගෙවීම් ලැබීමට සංස්ථාවට ඇති අයිතිය තහවුරු කර ඇති විටය. එය වෙනත් ආදායම්වලට ඇතුළත් වේ.

**2.2.3. අදාළ පාර්ශව ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය-**LKAS** 24 (අදාළ පාර්ශව හෙළිදරව් කිරීම්) අනුව**,** ප්‍රධාන කළමනාකරණ පිරිස් (**KMP)** යනු ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**,** මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරියක් සහ වගකීමක් ඇති අයයි. ඉහත නිර්වචනයට අනුව ඉහත නිර්වචනයේ දක්වා ඇති ක්‍රියාකාරකම් තුනම ක්‍රියාත්මක කිරීමේ බලය සහ වගකීම යන දෙකම එම පුද්ගලයාට නොමැති නම් පුද්ගලයෙකු **KMP** ලෙස සැලකිය නොහැකිය.

<u>2.3.**අයභාරය හඳුනාගැනීම**</u>

සිමෙන්ති මළු මිලදී ගැනීම සහ විකිණීමෙන් සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම තුලින් ජනිත වන ආදායම් සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ඡේදයට අදාල ප්‍රමාණය මිනුම් කර හඳුනාගනු ලැබේ.

ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු වෙළඳ වට්ටම් සහ විකුණුම් බදුවල සාධාරණ වටිනාකම අනුව ය. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ

2.3.1**භාණ්ඩ විකිණීම**

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානමහාඵවායේ අයිතිය ගැනුම්කරුවෙත පැවරීමෙන් පසුව වේ.

2.3.2**පොලී ආදායම**

වත්කම්වල ඵලදායි පොලී අනුපාතය සැලකිල්ලට ගන්නා කාල සමානුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

2.3.3. **වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.4 **ණය ගැනීමේ පිරිවැය**

සියලුම ණය ගැනීමේ පිරිවැය ඔවුන් දරන කාල සීමාව තුළ ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත.

2.5 **ආදායම් බදු**

ආදායම් බදු වියදම් නියෝජනය කරන්නේ දැනට ගෙවිය යුතු බදු එකතුවයි.

2.6 **දේපල, පිරියත සහ උපකරණ**

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.

ක්ෂය වීම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදි අදාළ වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායි ජීවකාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.ක්ෂය ගණනයෙදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්**
**2021දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

| විස්තරය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 6.67% |
| යන්ත්‍ර සූත්‍ර | 12.5% |
| පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ | 25.0% |
| මොටර් රථ වාහන | 25.0% |
| මෙවලම් හා උපකරණ | 25.0% |
| ලී බඩු හා සවිකිරීම් | 25.0% |
| රේල් පීලි | 10.0% |

වත්කමක ක්ෂයවීම් අනුපාතිකය, ඵලදායි ජීව කාලය හෝ අවශේෂ වටිනාකමෙහි සැලකිය යුතු වෙනසක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ නම්, එම වත්කමේ ක්ෂය කිරිම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.
රු.10,000/= ට අඩු දේපළ පිරියත හා උපකරණ ප්‍රාග්ධනීකරණය කර නැති අතර ඒ වෙනුවට මිලදී ගත් වර්ෂයේ වියදමක් ලෙස අය කෙරේ. අලුතින් මිලදී ගැනීම්වල පිරිවැය ඉදිරි වර්ෂයේ සිට ක්ෂයවීම් ප්‍රමාණය ගණනය කර ඇත.

### 2.7 වත්කම් ගවේෂණය කිරිම හා ඇගයීම

ශ්‍රී ලංකා ජනරජය විසින් 1977 සැප්තැම්බර් මස 20 වන දින නිකුත් කරන ලද අංක 283/2 දැණ ගැසට් පත්‍රය මගින් අක්කර 5,164 රූඩ් 0 පර්චස් 25 කින් යුත් ඛණිජ නිධියක් සහිත ඉඩම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්තාවට පවරා ඇත.
මෙම සම්පූර්ණ ඉඩම වසර 50ක කාලයට 1993 වසරේදි පුත්තලම සිමෙන්ති (පෞද්ගලික) සමාගමට සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය හුණුගල් කැණීම් කිරිම සඳහා බදු ගිවිසුමක් යටතේ බදු දී ඇති අතර එහි නාමය හොල්සිම් ලංකා (පෞද්ගලික )සමාගම ලෙස වෙනස් කල අතර වර්තමානය වන විට සියාම් සිටි සිමෙන්ති ලංකා (පෞද්ගලික ) සමාගම ලෙස භාවිතා කරනු ලැබේ.
මෙම ඉඩමේ වටිනාකම ගිණුම් ගත කිරිම සඳහා තක්සේරු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ලැබේ.

### 2.8 විකිණීම සඳහා තබා ඇති වත්කම්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව මෙම දුම්රිය එන්ජිම යුද සමයට පෙර මෙහෙයුම් සඳහා යොදා ගෙන තිබුණි. ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි ප්‍රකාරව එය ජංගම නොවන වත්කම් යටතේ විකිණීම සඳහා තබා ඇති වත්කම් කාණ්ඩයට මාරු කර ඇත
මෙම දේපලට අදාලව ඉදිරියට ගෙන යනු ලබන අගයෙහි වැඩිවීමක් තිබේනම් පෙරදී හඳුනාගනු ලැබූ හානි සඳහා පියවීම් කර ඉතිරියක් වේනම් එය ප්‍රත්‍යාගණිත සංචිතයට හඳුනාගනු ලැබේ. එම වටිනාකමේහි අඩුවීමක් වේනම් එය වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) යටතේ හඳුනාගත යුතුවේ.

### <u>2.9.තොගය</u>

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.
පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

### 2.9.1. කන්කසන්තුරේතිබෙන කැණීම් කරන ලද හුණුගල්

පලාලි ගුවන් තොටුපළ ධාවන පථය සකස් කිරිම සඳහා භාවිත කරන ලද කැණීම් කර ඉතිරි වි තිබූ හුණුගල් තොගය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංස්ථාව වෙත භාර දී තිබුණි. ඇගයීම් ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. සමස්ථ ප්‍රමාණයන් බාණ්ඩ හයක් යටතේ මුළු තොගය ඝන මීටර් 25,750.10 විය. මෙම තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2021දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

**2.10වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

වෙළඳ ගෙවීම් සාමාන්‍ය ණය කොන්දේසි මත බැඳීම් වන අතර පොලී දරන්නේ නැත. විදේශ මුදල් ඒකකයක් මගින් ගෙවිය යුතු වෙළඳාම් වාර්තා කරන දිනයේ විනිමය අනුපාතිකය භාවිතයෙන් ශ්‍රී ලංකා රුපියල්වලට (රු.) පරිවර්තනය කරනු ලැබේ. විදේශ විනිමය ලාභ හෝ පාඩු වෙනත් ආදායම් හෝ වෙනත් වියදම්වලට ඇතුළත් වේ.

**2.11. බැංකු ණය සහ අයිරා**

සඵල පොලී අනුපාතය පදනම මත පොලී වියදම හඳුනාගෙන ඇති අතර මූල්‍ය පිරිවැයට ඇතුළත් වේ.

**2.12 වෙන් කිරිම්,අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්**

මූල්‍ය තත්ව ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනට යම් කරුණක් සම්බන්ධව වගකීමක් ඇතිවේනම් හෝ ඊට අදාළව සම්පත් ගලායාමට සම්භාවිතාවයක් තිබේනම් හා එම සම්පත් ගලායෑම ඇස්තමේන්තු කල හැකි නම් ඊට අදාළව වෙන්කිරීම් සිදු කල යුතු වේ.
ආයතනයේ සම්පත් ගලායෑමේ ප්‍රවණතාවයක් නොමැති වුවද සියලුම අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.
ආයතනය තුලට සම්පත් ගලාඒමේ ප්‍රවණතාවයක් වේනම් පමණක් අසම්භාව්‍ය වත්කම් පිළිබද මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින්වෙළඳ ලැබිය යුතු වටිනාකම් වෙනුවෙන් අධිකරණයේ නඩු දහතුනක් (13) ගොනු කර ඇත.

| නඩු අංකය | ගොනු කරන ලද වර්ෂය | වගකිව යුතු පාර්ශවය | හිමිකම (රු.) |
|---|---|---|---|
| <u>වෙළඳ</u> | | | |
| 47146/MR | 2003 | යූ.එන් අබේසේකර | 679,500.00 |
| 56783/MR | 2003 | ආර්.එම්.පි.ඩී එම් රාජපක්ෂ | 1,656,000.00 |
| 47175/MR | 2003 | කේ.ඒ.ජේ ජයන්ත පෙරේරා | 110,500.00 |
| 000262/08 | 2003 | නිව් අයිලන්ඩ් හාඩ්වෙයාර් | 198,000.00 |
| 56780/MR | 2003 | වින්සර බෙදාහරින්නෝ | 195,400.00 |
| 56781/MR | 2003 | ප්‍රසන්න කන්ස්ට්‍රක්ෂන් | 92,250.00 |
| 000260/08 | 2003 | මයන්ත ට්‍රේඩර්ස් | 65,508.00 |
| 56782/MR | 2003 | ආර්.ඒ .එස්.කේ රාජපක්ෂ | 810,683.6 |
| IR 324/03/11 | 2011 | ලේඛා පෙරේරා | 3,842,002.00 |
| CID | 2003 | පි.එම්.කේ සෙනාරත්න | 6,000.00 |
| CID | 2003 | අයි.ඩී.ටී චන්ද්‍රසිරි | 5,000.00 |
| CID | 2015 | ආර්.සී.සී ට්‍රේඩින් | 6,655,795.00 |
| **වෙනත්** | | | |
| 13365-වාහන | 2013 | බී.එම් සුගතදාස | |
| BR 232-**ඉඩම්** | 2012 | පුත්තලම ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් | |
| B/312/PC/2014 | 2014 | යාපනය,රජයේ දේපළ වංචාව | |

**2.12.2 තෙල් ටැංකි සංකීර්ණය සඳහා ලැබිය යුතු බදු කුලී**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඉදිකර භාවිතා කරන ලද ටැංකි 5කින් යුත් තෙල් ටැංකි සංකීර්ණය. 1990 වසරට පෙර මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඉදිකර භාවිතා කරන ලදී.
යුධ සමයේ සිට සීමාසහිත සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජස් ටර්මිනල්ස් විසින් ඔවුන්ගේ මෙහෙයුම් සඳහා මෙම තෙල් ටැංකි සංකීර්ණය භාවිතා කරනු ලැබේ.මෙම ටැංකි සඳහා කුලී ගෙවීම සම්බන්ධව අදාළ පාර්ශවයන් සමග පැවති සාකච්ඡාවලදී ,2010 සිට කුලී ගෙවීමට තීරණයක් ගත් අතර
මෙම ටැංකි සඳහා කුලී වශයෙන් කිසිදු මුදලක් ගෙවා නොමැත. එම සමාගමෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.184,680,000.00 වේ.

## 2.13 සේවක ප්‍රතිලාභ

### 2.13.1 අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්

අර්ථකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන වගකීම අදාළව වාර්තා කරන දිනට වර්තමාන වටිනාකමට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගෙන ගත යුතු වේ.

සංස්ථාවේ සේවකයින්ගේ ප්‍රතිපාදන සැලසෙන්නේ ඔවුන්ගේ වැටුප්, දීමනා සහ වාර්තා කරන දිනයේ සේවා කාලය මත පදනම්ව වේ. සේවක ප්‍රතිලාභ සම්බන්ධ වගකීම් ගණනය කිරීමේදී පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් වෙනත් විස්තීර්ණ ආදායමකින් හෝ වියදමකින් හඳුනා ගැනේ.

සංස්ථාවේ වසර 5කට අඩු අඛණ්ඩ සේවා කාලයක් ඇති සේවකයන් ඇතුළු සියලුම සේවකයන්ට 1983 අංක 12 දරන පාරිතෝෂිත දීමනා ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත.

කෙසේ වෙතත්, පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ, සේවකයෙකුට වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සේවකයින්ට විශ්‍රාම යන පාරිතෝෂිත දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් සඳහා ආයෝජනයක් කර ඇත.

### 2.13.2 සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල

සංස්ථාවේ සියලුම සේවකයින්ගේ සේවක අර්ථසාධක සඳහා පදනම් වන වැටුප මත සේවක අර්ථසාධක අරමුදල් දායකතවයලෙස 10% ක් දායක වන අතර සංස්ථාව 12% ලෙසත් සේවක භාරකාර අරමුදල ලෙස 3% ලෙසත් දායක වේ.

### 2.13.3 වෛද්‍ය පහසුකම් සඳහා වූ යෝජනා ක්‍රමය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද අනුමත සීමාවන් තුළ ප්‍රතිලාභයක් ලෙස සංස්ථාව විසින් සේවකයින්ට වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන යයි. මෙම යෝජනා ක්‍රමය සඳහා ස්ථාවර දායකත්වය සේවකයාගේ මාසික වැටුපෙන් අඩු කරනු ලැබේ.

**03.**

| දේපල, පිරියත හා උපකරණ<br>පිරිවැය | **2021.01.01** දිනට ශේෂය | පෙර වර්ෂ සඳහා ගැලපීම් | වර්ෂය තුල වූ එකතුකිරීම් | වර්ෂය තුල වූ අඩුකිරීම් | **2021.12.31** දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 797,795,981 | - | - | - | 797,795,981 |
| මෝටර් රථ | 4,562,891 | - | 783,874 | - | 5,346,765 |
| ලී බඩු හා සවිකිරීම් | 4,779,275 | - | 468,700 | - | 5.247,975 |
| මෙවලම් හා උපකරණ | 302,840 | - | - | - | 302,840 |
| | **807,440,987** | **-** | **1,252,574** | **-** | **808,693,561** |
| **සමුච්චිත ක්ෂය වෙන්කිරීම්** | | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 395,981 | - | - | - | 395,981 |
| මෝටර් රථ | 4,562,891 | - | - | - | 4,562,891 |
| ලී බඩු හා සවිකිරීම් | 4,585,184 | 30,000 | 118.493 | - | 4,673,677 |
| මෙවලම් හා උපකරණ | 288.630 | - | - | - | 288,630 |
| | **9,832,686** | **30,000** | **118,493** | **-** | **9,921,179** |
| **ශුද්ධ පොත් අගය** | **797,608,301** | | | | **798,772,382** |

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට කන්කසන්තුරේ අක්කර 751ක යුතු ඉඩමක් ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම ගිණුම් ගත කර නොමැත.

මෙම මුළු ප්‍රමාණයෙන් අක්කර 231ක් පිඹුරුපත් අංක ඒ 2099 යටත් රජයෙන් ලද ඉඩමක් වන අතර එය අංක : 12,156 දරණ 1960 ජුලි 08වන දිනැති ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇත. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව, එහි පරිපාලන ගොඩනැගිලි හා තෙල් ටැංකි සංකීර්ණය මෙම භූමි ප්‍රමාණය තුල ඉදිකර ඇත.ඉතිරි ප්‍රමාණය වන අක්කර 520ක ප්‍රමාණය පිඹුරුපත් අංක ඒ1557, ඒ1484,ඒ1562හා ඒ2438හි ඇතුලත් වන අතර එය 1964 අංක 14,012දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැසට් පත්‍ර යේ වගන්ති අංක 460 යටතේ වන්දි ගෙවා අත්පත් කරගෙන ඇත.
පහත සඳහන් රාජ්‍ය ආයතන සඳහා මීට පෙර ඉඩම් ලබාදීමේ ක්‍රියාවලියක් පැවැති අතර අවසන් තීරණය සමාලෝචනය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිවරයා ගෙන් සැදුම් ලත් විශේෂ කමිටුව පත් කර ඇත. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ පිහිටි අක්කර හයක ඉඩම් ඔප්පු අංක 2354 යටතේ අප සතුව ඇත. නමුත් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම ඉඩමේ සුනාමි නිවාස ඉදිකර දී ඇත. මෙම ඉඩමට වන්දි ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටි අතර ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
1967 ජූලි 12 වැනි දින ලංකා රජයේ ගැසට් අංක 14,756/7 මගින් සංස්ථාවට අයත් කොල්ලුපිටියේ 87.9P ප්‍රමාණයෙන් යුත් ඉඩම, 2013 සහ 2017 වර්ෂවලදී නැවත තක්සේරු කිරීමට අප කටයුතු කර ඇති අතර එහි වටිනාකම රුපියල් 712,500,000/ සටහන් කර ඇත. මූල්‍ය ප්‍රකාශයේ පිළිවෙලින් රු.735,000,000/-. උකස් බැඳුම්කර අංක 2426 යටතේ, 287, ගාලු පාර, කොළඹ-03 දරන ස්ථානයේ පිහිටි ඉඩම 2008 පෙබරවාරි 25 වැනි දින රුපියල් 172,000,000 ක ණය පහසුකමක් ලබා ගැනීම සඳහා උකස් කර ඇත. මෙම ඉඩමේ වටිනාකම 2018 දක්වා ආයෝජන දේපළෙහි ඇතුළත් වන අතර, 2019 සිට දේපලපිරියත සහ උපකරණවල ඉඩම් කාණ්ඩයට වටිනාකම මාරු කර ඇත.

1977 සැප්තැම්බර් 20 වැනි දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ අංක 283/2 ගැසට් පත්‍රය මගින් ඛනිජ ගල්කොරිය සහිත ඉඩම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට පැවරීම. එහි විශාලත්වය 5,164A:0R:25P වේ. සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් කැණීම සඳහා අංක 495 ගිවිසුම මගින් 1993 සිට වසර 50 ක කාලයකට පුත්තලම සිමෙන්ති (පුද්ගලික) සමාගමට මුළු ඉඩම බදු දී ඇති අතර පසුව එම සමාගම Ms.Holcim Cement Lanka (Private) Limited ලෙස නම වෙනස් කරන ලදී. මේවන විට ඔවුන් භාවිතා කරනුයේ සියැම් සිටි සිමෙන්ති ලංකා සමාගම වේ.2019 දී පරිපූරක බදු ගිවිසුම අංක. 268 ඔවුන් සමඟ 2019 නොවැම්බර් මස අත්සන් කරන ලද අතර බදු කුලී වර්ධක අනුපාතය සහ කාලසීමාව ඇතුළත් විය.
එම ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්තාව ලැබුණු පසු එම ඉඩමේ වටිනාකම සටහන් කෙරේ.
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව 2003 ජූනි 6 වැනි දින අත්සන් කරන ලද අංක 26 ගිවිසුමට අනුව පාලවි හි ඉඩම 12A: 3R: 30P ප්‍රමාණයෙන් සියැම් සිටි සිමෙන්ති ලංකා සමාගම වෙත බදු දී ඇත.
2013 වර්ෂයේදී පුත්තලම පාලාවි ප්‍රදේශයේ අක්කර 221 ක වනාන්තර ඉඩම අපට අයිති ඉඩමක් ලෙස හඳුනාගෙන ඇති අතර එහි වටිනාකම ලෙස 2013 මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත්තේ 170A:3R:28.3P සඳහා පමණි. ඉන් අක්කර පනස් එකක භූමි ප්‍රමාණය තවමත් අගය කර නොමැත.

මුල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2021 දෙසැම්බර් මස 31 දිනට**

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **04.** | **විකිණීම සඳහා තබා ඇති වත්කම්** | රු. | රු. |
| | දුම්රිය මෙහෙයුම් මැදිරි | 750,000 | 750,000 |
| | | **750,000** | **750,000** |
| **05.** | **දිගුකාලීනව ලැබියු යුතු දෑ** | | |
| | ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වූ දෑ | 360,311,323 | 424,169,977 |
| | ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වූ අභ්‍යන්තර ගනුදෙනු සඳහා ලැබිය යුතු වූ දෑ | 396,912,560 | 333,053,906 |
| | ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් | (757,223,883 ) | (757,223,883) |
| | | - | - |
| **06.** | **ආයෝජනයන්** | | |
| | භාණ්ඩාගාර බිල්පත් | 7,320,610 | 7,008,828 |
| | ***<u>පරිපාලිතයන් සහ ආශ්‍රීතයන්ගේ ආයෝජනයන්</u>*** | | |
| | පරිපාලිත - ලංකා සිමෙන්ති සමාගම | 617,662,779 | 617,662,779 |
| | මහවැලි මෙරීන් සිමෙන්ති (පෞද්.) සමාගම | 6,400,000 | 6,400,000 |
| | | **631,383,389** | **631,071,607** |

ලංකා සිමෙන්ති සමාගම වෙනමකළමනාකාරීත්වයක් මගින් පාලනය සහ අධීක්ෂණය සිදු කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය මව් සමාගමේ අධ්‍යාක්ෂවරුන් තිදෙනෙකු අන්තර්ගතය.ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිවරයාට මහවැලි මැරයින් සිමෙන්ති (පුද්ගලික) සමාගමේ අධ්‍යාක්ෂ ධූරය හිමිවේ.

| | | | |
|---|---|---|---|
| **07.** | **තොගය** | | |
| | කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ අමුද්‍රව්‍ය හා නොනිමි වැඩ | 238,256 | 238,256 |
| | | **238,256** | **238,256** |
| **08.** | **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ** | | |
| | වෙළඳ ණයගැතියෝ | 33,779,005 | 48.395,643 |
| | අඩමාණ ණය වෙන් කිරීම් | (1,688,950) | (977,166) |
| | ලැබිය යුතු කුලී | 2.217,730 | 3,092.621 |
| | දේශ්‍රීයඇණවුම්මතකලින්ලැබීම් | 1,131,622 | 1,131,622 |
| | ලැබිය යුතු තැම්පත් | 1,624,626 | 1,624,626 |
| | සිමෙන්ති මත ලැබිය යුතු තැම්පත් | 976,971 | 976,971 |
| | උත්සව අත්තිකාරම් | 16,875 | - |
| | සේවක ආපදා ණය/මෝටර් බයිසිකල් ණය හා අනෙකුත් | 2,847,570 | 3,029,920 |
| | කලින් ගෙවූ වියදම් | 255,938 | 244.008 |
| | ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ | 1,253,580 | 1.253,580 |
| | විවිධ අත්තිකාරම් | 260,947 | 240,947 |
| | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | 48,000 | 48,000 |
| | ලැබිය යුතු එකතු කල අගය මත බදු | 9,935,654 | 9,935,654 |
| | ලැබිය යුතු ආර්ථික සේවා ගැස්තු | 126,758 | 126,758 |
| | ලැබිය යුතු රඳවාගත් බදු | - | 4.014,641 |
| | ලැබිය යුතු පොළී | 355.264 | 206,754 |
| | එන්.එච්.ඩී.ඒ. ආයතනයෙන් ලැබිය යුතු දෑ | 672,706 | 672,706 |
| | | **53,814,296** | **74.017,285** |

**08.1සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු දේ**

සිමෙන්ති අලෙවියේ ප්‍රතිඵලයක් ලෙස ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු ණය රු.1,940,555/- ක මුදලවෙළඳ ණයගැති ශේෂයට ඇතුළත් වේ. තවද, අනෙකුත් ලැබිය යුතු මුදල් රු. 1,253,580/-. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ දක්වා ඇත.

**8.2 අඩමාණ ණය ප්‍රතිපාදන**

සංස්ථාවේ කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව දිගුකාලීන වෙළඳ ණය සඳහා 5% අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2021 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | **2021** | **2020** |
|---|---|---|
| **9. මුදල් හා මුදල් හා සමාන දෑ** | රු. | රු. |
| බැංකුවේ තිබෙන මුදල් | | |
| - ලංකා බැංකුව, ලේක් වීව් ශාඛාව | 5,211,299 | 397,868 |
| - ලංකා බැංකුව, ආයතනික ශාඛාව | 1.700.250 | 4,412,985 |
| - මහජන බැංකුව, ලිබර්ටි ප්ලාසා ශාඛාව | 1,873,962 | 1.342,736 |
| කෙටිකාලීන බැංකු තැම්පතු | 89.775,089 | 57.367,759 |
| | **98,560.600** | **63.521,348** |
| **10. පොළී ගෙවිය යුතු වගකීම් - බැංකු ණය** | | |
| ලංකා බැංකුව, -83124176- කෙටිකාලීන ණය | 10,000.000 | 9,000,000 |
| -දිගු කාලීන | 48.700.000 | 58.700.000 |
| | **58,700,000** | **67,700,000** |

2017.10.10 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් කරන ලද ඉල්ලීමට අනුව, ලංකා බැංකුවට ගෙවිය යුතුව තිබූ රු.97,700,000/- ක බැංකු ණය මාස 120 ක ආපසු ගෙවීමේ කාලය සහිතව ණය අංක 83124176 යටතේ නැවත සකස් කරන ලදී.

| | | |
|---|---|---|
| **11. ගෙවියයුතු බැංකු ණයපොළී** | | |
| ගෙවිය යුතු බැංකු ණය පොළී | 518,352 | 451,421 |
| | **518.352** | **451.421** |
| **12. දිගුකාලීන වගකීම්** | | |
| භාණ්ඩාගාර අත්තිකාරම් | 492,426,190 | 492,426,190 |
| | **492,426,190** | **492,426,190** |
| **13. විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම්** | | |
| වර්ෂ ආරම්භකදිනට විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම්ශේෂය | 5,519,302 | 4.674,578 |
| වර්ෂය තුල ණය මත කල කපාහැරීම් | (163,350) | (17,009) |
| වර්ෂය තුල මුදලින් කල ගෙවීම් | (1,040,170) | - |
| | 4,315,782 | 4,657,569 |
| වර්ෂයට අදාළ වෙන්තිරීම් | 430,663 | 861,733 |
| වර්ෂ අවසාන දිනටවිශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම් ශේෂය | **4,746,445** | **5,519.302** |
| **14. වෙළද හා අනෙකුත් ගෙවිය යුතු දෑ** | | |
| වෙළද ණයහිමියෝ | 3,090,311 | 3,090,311 |
| සිමෙන්ති අත්තිකාරම් | 1,079,410 | 1,079,410 |
| සියැම් සිටි සිමෙන්ති ලංකා සමාගමෙන් ලද අත්තිකාරම් | 66.550 | - |
| උපචිත වියදම් | 3,294,343 | 3,760,237 |
| බී.සී.සී. ආයතනයට ගෙවිය යුතු කුලී | 766,150 | 766,150 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු කුලී | 3.572.724 | 3,572,724 |
| ගෙවිය යුතු තැම්පතු | 1,253,126 | 1,281,626 |
| ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු | 126,756 | 126,756 |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 1.881,255 | 1,881255 |
| වැටුප් පාලන ගිණුම | 29,727 | 140,753 |
| නොගෙවූ වැටුප් | 51,645 | 53,070 |
| රදවාගත් කාසි | 468 | 468 |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් | 123,381 | 135,254 |
| ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් | 16,931 | 18,550 |
| ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂිත | 116,337 | 2,287 |
| ගෙවිය යුතු ආදායම් බදු | 6,709,944 | - |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 12,366,678 | 12,366,678 |
| | **34,545,736** | **28,274,104** |

| | | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **15.** | ආදායම් | | |
| | හුණුගල් නිධිය සහිත ඉඩමෙන් ලැබෙන කල්බදු | 60,440,949 | 57,881,623 |
| | ඉඩම්වලින් ලැබෙන ආදායම් | 4,815.266 | 4,424,070 |
| | | **65,256,215** | **62,305,693** |
| **15.1** | **ඉඩම්වලින් ලැබෙන ආදායම්** | | |
| | ඉඩම්වලින් ලැබෙන කුලී ආදායම් | 4,893,331 | 4.424,070 |
| | *අඩුකළා-*කොමිස් මුදල | (78,065) | - |
| | | **4,815.266** | **4,424,070** |
| **16.** | වෙනත් ආදායම් | | |
| | සේවක ණය මත ලද පොලී | 171,478 | 113,366 |
| | තැම්පතු මත ලද පොලී | 4,380,682 | 4,192,841 |
| | භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී | 336.508 | 423,924 |
| | විවිධ ආදායම් | 50 | 25 |
| | | **4,888,718** | **4,730,156** |
| **17.** | මූල්‍ය වියදම් | | |
| | බැංකු අයිරා පොලී | - | 3,000 |
| | බැංකු ණය පොලී | 5,511,774 | 7,452.517 |
| | | **5,511,774** | **7,455,517** |
| **18.** | බදු පෙර ලාභය | | |
| | බදු පෙර ලාභය ගණනයේදී පහත සඳහන් වියදම් අඩුකර ඇත: | | |
| | සේවක පිරිවැය | 10,823,346 | 10,924,522 |
| | අධ්‍යක්ෂ පාරිතෝෂිත | 2,878,051 | 1,845,770 |
| | ක්ෂය වෙන්කිරීම් | 118,493 | 169,865 |
| | විගණන ගාස්තු | 430,000 | 425,000 |
| | පාරිතෝෂිත වෙන්කිරීම් | 430,663 | 844,724 |
| | අඩමාණ ණය වෙන් කිරීම | 711,784 | - |
| **19.** | **අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)** | | |
| | අස්පෘශ්‍ය වත්කම්(වෙළඳ ණයගැතියෝ) | (14,316,639) | - |
| | | **(14,316,639)** | **-** |
| **20.** | **රඳවාගත් ඉපැයුම් සඳහා කරන ලද පෙර වර්ෂ ගැලපීම්** | රු. | |
| | **2020/12/31 දිනට රඳාගත් ඉපැයුම්** | | (276,879,869) |
| | ***ගැලපීම්*** | | |
| | ස්ථාවර තැන්පතු පොලී ආදායම | (29,532) | |
| | වැටුප් හා වේතන | 225,000 | |
| | ඉඩම් මගින් ලද ආදායම් | 890 | |
| | භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම | 5,583 | |
| | තාවකාලික සේවකයින් සඳහා වූ වියදම් | (20,000) | |
| | අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය | (76,000) | |
| | තැපැල් හා දුරකථන වියදම් | 4,883 | |
| | විගණන ගාස්තු | (12,100) | |
| | කුලී ආදායම් | 16,429 | |
| | ක්ෂය | 30,000 | 145,153 |
| | | | **(276,734,716)** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2022පෙබරවාරි මස 24වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල අතර නිකුත් කිරීමටද අනුමැතිය ලබාදෙන ලදි.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය**
**2021 දෙසැම්බර් මස31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | යොමුව | **2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|---|
| ආදායම | | 65,256,215 | 62.305,693 |
| විකුණුම් පිරිවැය | අ | - | - |
| දළ අලාභය | | **65,256,215** | **62,305,693** |
| වෙනත් ආදායම් | ආ | 4,888,718 | 4.730,156 |
| බෙදාහැරීම් වියදම් | ඇ | (7,020) | - |
| පරිපාලන වියදම් | ඇ | (19,983.648) | (18,861,766) |
| මූල්‍ය වියදම්වලට පෙර ලාභය | | **50,154,265** | **48.174,083** |

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන**
**2021 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 2021 | 2020 |
|---|---|---|
| **අ. විකුණුම් පිරිවැය** | | |
| | රු. | රු. |
| **සිමෙන්ති අලෙවිය** | | |
| ආරම්භක තොගය | - | - |
| මිලදී ගැනුම් හා සෘජු පිරිවැය | - | - |
| අඩුකිරීම් : අවසාන තොගය | - | - |
| | - | - |
| **කොන්ක්‍රීට් කණු අලෙවිය** | | |
| ආරම්භක තොගය | - | - |
| මිලදී ගැනුම් | - | - |
| සෘජු පිරිවැය | - | - |
| අඩුකිරීම් : අවසාන තොගය | - | - |
| | - | - |
| | **-** | **-** |
| **ආ. වෙනත් ආදායම්** | | |
| සේවක ණය මත ලද පොලී | 171.478 | 113,366 |
| තැන්පතු මත ලද පොලී | 4,380,682 | 4,192,841 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී | 336.508 | 423,924 |
| විවිධ ආදායම් | 50 | 25 |
| | **4,888,718** | **4,730,156** |
| **ඇ. බෙදාහැරීම් වියදම්** | | |
| දැන්වීම් හා ප්‍රදර්ශන වියදම් | 7,020 | - |
| | **7,020** | **-** |
| **ඈ. පරිපාලන වියදම්** | | |
| වැටුප් හා වේතන | 7,634,891 | 7,816,936 |
| අතිකාල ගෙවීම් | 586.475 | 388,257 |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 890,638 | 901,746 |
| සේවක භාරකාර අරමුදල් වියදම් | 222,659 | 225.436 |
| වෛද්‍ය නිවාඩු සඳහා කල ගෙවීම් | 501,332 | 532,285 |
| අධ්‍යක්ෂ පාරිතෝෂිත වියදම් | 2,878.051 | 1,845,770 |
| විගණන කමිටු රැස්වීම් වියදම් | 95,500 | 37.500 |
| වාර්ෂික ප්‍රසාද මුදල් | 162,000 | 174,600 |
| තේ සඳහා වූ දීමනාව | 235,500 | 258,550 |
| ආහාර දීමනාව | 477.200 | 556.200 |
| කාර්ය මණ්ඩල පුහුණුකිරිම | 100,000 | - |
| වෛද්‍ය පහසුකම් | 12,648 | 70,512 |
| සුභසාධන වියදම් | 281,765 | 478,367 |
| නිවාස ණය මත පොලී ප්‍රතිපූර්ණය කිරීම | 45,937 | 58,518 |
| කාර්යාල උපකරණ ක්ෂය | 118,493 | 169,865 |
| විදුලි බිල්පත් වියදම් | 171,820 | 141,898 |
| තැපැල් හා දුරකථන වියදම් | 187,584 | 206.465 |
| මුද්‍රණ හා ලිපිලේඛන වියදම් | 286,551 | 355,338 |
| | **14,889,047** | **14,218,243** |

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන**

| **2021 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2018** | **2017** |
|---|---|---|
| | රු. | රු. |
| *පෙර පිටුව ...............* | **14,889.047** | **14,218,243** |
| කුලීවියදම් | 990,000 | 990,020 |
| වාර්ෂික වාර්තා මුද්‍රණය හා වෙනත් වියදම් | 313.895 | - |
| වරිපනම් ගාස්තු | 6,930 | 7,546 |
| පොදු වියදම් | 250,770 | 286,166 |
| ගමන් ගාස්තු වියදම් | 112,516 | 70,031 |
| ඉඩම් නීරික්ෂන හා අනෙකුත් වියදම් | 609,692 | 552,506 |
| කොල්ලුපිටිය ඉඩමට අදාළ වියදම් | 54,849 | 545.330 |
| මෝටර්රථ වියදම් | 558,501 | 69,785 |
| ලේකම් කටයුතු සඳහා වූ වියදම් | 24,000 | 54.667 |
| නීති හා වෘත්තිය ගාස්තු | 4,968 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම් | 8,300 | 14,750 |
| ප්‍රකාශන වියදම් | - | 9,920 |
| විගණන ගාස්තු | 430,000 | 425,000 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 430,663 | 844,724 |
| ජල වියදම් | 40,458 | 33,895 |
| බැංකු ගාස්තු | 95,924 | 107,290 |
| මිනුම් වියදම් | 5,756 | - |
| තාවකාලික සේවකයින් සඳහා වූ වියදම් | 431,134 | 530,743 |
| සුළු උපකරණ වියදම් | 14,461 | 1,150 |
| උපදේශන වියදම් | - | 100,000 |
| අඩමාණ ණය | 711,784 | - |
| | **19,983,648** | **18.861,766** |

**ආදායම් බදු ගණනය**

**2021තක්සේරු වර්ෂය සඳහා**

| | යොමුව | | +රු. | -රු. |
|---|---|---|---|---|
| 2021 වර්ෂයට අදාළ ලාභය | **P & L** | | 44,642,491 | |
| තැම්පතු මත ලද පොළී | **P & L** | | | 4.380. |
| භාණ්ඩාගාර බිල්පත් මත ලද පොළී | **P & L** | | | 336. |
| ප්‍රාග්ධන දීමනාව | **Sch. I** | | | 182, |
| ක්ෂයකිරීම් | **P & L** | | 118.493 | |
| අඩමාණ ණය | **P & L** | | 711,784 | |
| දැන්වීම් හා ප්‍රදර්ශන වියදම් | **P & L** | | 4,563 | |
| සේවක පාරිතෝෂිත වෙන්කිරීම් | **P & L** | | 430,663 | |
| සේවක පාරිතෝෂිත ගෙවීම් | **P & L** | | | |
| | | | **45,907,994** | **5,939,** |
| **වර්ෂයේ වූ ගැලපීම් කරන ලද ලාභය** | | | | **39,968,** |
| පොළී ආදායම | | | | 4,717, |
| **මුළු ව්‍යවස්ථාපිත ආදායම්** | | | | **44,685,** |
| **තක්සේරු කල හැකි ආදායම** | | | | **44,685,** |
| අඩුකිරීම් : | | | | |
| 2020සිට ඉදිරියට ගෙන එනු ලබන අලාභය | | - | | |
| 2021 වර්ෂයේ අලාභය | | - | | |
| ව්‍යවස්ථාපිත ආදායමෙන් 100% | | - | | |
| 2022වර්ෂයට ගෙන යනු ලබන අලාභය | | **-** | | |
| **බදු අය කළ යුතු ලාභය** | | | | **44,685,** |
| **ගෙවිය යුතු මුළු ආදායම් බදු** | | 44.685,770 | 24% | 10.724, |
| රඳවාගැනීම් මත බදු අඩුකිරීම් 2020 | 4,014,641 | | | |
| 2021 ආදායම් බදු අය කිරීම් | (4,014,641) | | | (4,014,6 |
| | **-** | | | |
| **ගෙවිය යුතු ආදායම් බද්ද** | | | | **6.709,** |



ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව බදු හඳුනාගැනීම් අංකය : 409000134 0000

ආදායම් බදු ගණනය

**2021 තක්සේරු වර්ෂය සඳහා**

| **උපලේඛනය I - ප්‍රාග්ධන දීමනාව** | **අනුපාතය %** | **පිරිවැය** | **දීමනාව 2021** |
|---|---|---|---|
| වර්ෂය 2021 | | | |
| පරිගණක සහ දත්ත හැසිරවීමේ උපකරන | 20% | 468,700 | 93,740 |
| මෝටර් වාහන | 20% | 783,874 | 156,775 |
| | | **468,700** | **93,740** |
| වර්ෂය - 2020 | | | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ උපකරණ | 20% | 14,210 | 2,842 |
| ගොඩනැගිලි - ආරක්ෂක කුටි | 0% | 32,400 | - |
| | | **14,210** | **2,842** |
| වර්ෂය - 2019 | | | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ උපකරණ | 20% | 171,300 | 34,260 |
| | | **171,300** | **34,260** |
| වර්ෂය - 2018 | | | |
| | | | Nil |
| වර්ෂය - 2017 | | | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ උපකරණ | 20% | 256,061 | 51,212 |
| | | **256,061** | **51,212** |
| 2021 සඳහා ප්‍රාග්ධන දීමනාව | | | **182,054** |

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබදව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවේ සදහන් කරුණු පිළිබදව අදහස් දැක්වීම.**

**1.2 තත්වාගනනය කල මතය සදහා පදනම**

(අ) 2021.11.10 දිනැති ලිපිය මගින් මෙහි දක්වා ඇති වාහන ප්‍රත්‍යාගණනය කිරිම සදහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කළ අතර ,ඒ සදහා ලද පිළිතුරු ලිපිය අනුව තක්සේරු කටයුතු ආරම්භ කිරිමට අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ආ) )සංස්ථාවේ වත්කම් වලට අදාළව නඩත්තු කළයුතු වූ මෙම වත්කම් ලේඛනය පැරණි ගිණුම් ,ලිපි ලේඛණයන්ගෙන් ඒකරාශීකරගත හැකි තොරතුරු ඇතුලත් කරමින් 2016 වර්ෂයේදී සකස් කරන ලදී.වත්කම් ගිණුම් වල ඉදිරියට පැමිණි වටිනාකම රු.10,113,706/- වුවද තොරතුරු සොයාගත හැකි වත්කම් වල එකතුව අතර වෙනසට හේතුව වනුයේ තොරතුරු සොයා ගත නොහැකි වත්කම් වල වටිනාකමයි.

(ඇ)නිවැරදි කරන ලද මුදල් ප්‍රවහ පුකාශය 2022වර්ෂයේ ගිණුම් සමග ඉදිරිපත් කරනු ලැබේ.

(ඈ)2021.12.31 දිනට වූ ණයගැති ශේෂය වන රු.33,779,005/- යනු හදුනාගත් හා හදුනානොගත් ණය ගැතිශේෂ එකතුව වේ.එම මුළු එකතුවෙන් මෙම වෙන්කිරිම සිදු කර ඇත.එම වෙන් කිරිම හදුනාගත් හා හදුනානොගත් ණයගැති ශේෂයන්ට අදාල වේ.

(ඉ)ශේෂය තහවුරු කර ගැනිම සදහා ලිපි යවා තිබුණද ඒ සදහා නැවත පිළිතුරු ලිපි එවා නොමැත.

(ඊ)ලංකා සිමෙන්ති සමාගම ඈවර කිරිමට කටයුතු කරමින් පවතින අතර 2016 වර්ෂයෙන් පසු ලංකා සිමෙන්ති සමාගම විසින් සංස්ථාවට ගිණුම් ලබා දි නැත.

(උ) මෙවැනි සමීක්ෂණයක් සිදු කිරීම සදහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර එවැනි මූල්‍ය පිරිවැයක් දැරිමට ප්‍රමාණවත් මුදලක් සංස්ථාව සතු නොවේ.

**නීතිරීති/විධානයට යොමුව**

(අ) 2016 වර්ෂයේදී ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක්‍රියාත්මක වීමත් සමග සංස්ථාව තුළ ඉතිරි වූ සේවකයින් අතර නිසි බලතල පැවරිමක් සිදු කිරිම සදහා ප්‍රමාණවත් තනතුරු දරන සේවකයින් නැත.2022 වර්ෂය සදහා පිළියෙළ කර ඇති බලතල පැවරීමේ ලේඛණය ඉදිරි විගණන කමිටු රැස්වීම සදහා ඉදිරිපත් කිරිමට නියමිතව ඇත.

(ආ)ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයෙහි පවතින ප්‍රයෝජනයට ගතනොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්තශාලාපරිශ්‍රය පිරිසිදු කිරිම සදහා 2021.02.08 දිනැති ලද අංක අමප/21/0175/320/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම කටයුතු සිදුකිරිම සදහා විටින් විට කන්කසන්තුරේ බලා පිටත් විමට සිදු විය.එම අවස්ථාවන්හිදී අවශ්‍ය වියදම් සිදු කිරිම සදහා පමණක් මෙම අත්තිකාරම් මුදල් ලබාගෙන ඇත.එක් අත්තිකාරම් මුදලක් පියවීමෙන් පසු අනික් අත්තිකාරම් මුදල් ලබාගෙන ඇත.

**3 වෙනත් කරුණු**

(අ) 2016.10.20 වන දින එවකට රේඛීය අමාත්‍යාංශය වූ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී පැවති " 2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනාක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබද රැස්වීමේදී "ගනු ලැබූ තීරණය ප්‍රකාරව 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය අනුව ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථවේ ඉතිරි සේවකයින් යොදා ගනිමින් සංස්ථාව සතු වත්කම් බදු දී සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සහ කල්බදු ගිවිසුම් යාවත්කාලින කිරිම මගින් ආදායම් ඉපයිම සිදු කල යුතු බවට උපදෙස් ලබා දී ඇත.

සංස්ථාවේ මුළු අදායම රු.මි.70.14 වේ. එමගින් ආයතනයේ සමස්ථ පරිපාලන වියදම් සදහා දැරුමුදල් තුළ සේවක පඩි මෙන්ම ,ආයතනික කුළී මුදල්,ජල, විදුලි ගාස්තු,අධ්‍යක්ෂ පාරිශ්‍රමික, ලිපද්‍රව්‍ය වියදම් හා ක්ෂය අඩමාන ණය වෙන් කිරිම්ද ඇතුලත් වේ.

(ආ)ආදායම් බදු මුදල් 2022.07.27 දින චෙක්පත් අංක 660519 මගින් රු.6,709,944/- ක මුදලක් ගෙවීම් සිදු කර ඇත.

(ඇ)මෙම කොල්ලුපිටියේ පිහිටි ඉඩම ඉහල වාණිජ වටිනාකමින් යුත් ඉඩමක් වන අතර ,මිශ්‍ර ආයෝජන ඵලදායි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම නාගරික සංවර්ධන අධිකාරි පණතේ අනුමැතිය සහිතව කළ යුතු අතර සුදුසු ආයෝජකයකු සොයාගැනිම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.සුදුසු ආයෝජකයකු සොයා ගන්නා තෙක් මෙම භූමිය පිරිසිදුව තබා ගැනිම  මහ නගර සහා ආඥා පණතේ රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව සිදුකල යුතුව ඇත.මාස 03ක කෙටි කාල සිමාවකට විවිධ ආයතන සඳහා තාවකාලිකව රථ වාහන ගාල් කිරිමට අවසර ලබා දි ඇති අතර එමගින් සංස්ථාවට ආදායමක්ද ලැබෙමින් පවතී.නමුත්  එය ආයෝජන ව්‍යාපෘතියක් නොවේ. කොල්ලුපිටියේ පිහිටි ඉඩම තාවකාලිකව රථගාල් කිරිම  සඳහා ලබාදීමෙන් උපයන අදායම සමග  බැංකු ණය පොළිය සැසදිම  මගින් ප්‍රමාණවත් තෙරතුරක් ලබාගත නොහැකි බව පෙනි යයි.

(ඈ)මෙම ගැටළුව නිරාකරණය කර ගැනිම සඳහා කටයුතු කරමින් පවතින අතර රට තුළ පවතින වර්තමාන තත්ත්වය මත මෙම මුදල් ඉල්ලීම ප්‍රායෝගිකව මෙම අවස්ථාවේදී කල නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

(ඉ)ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වසර 50කට බදු දී ඇති පුත්තලම අරුවක්කාලුහි පිහිටි ඉඩම තුල සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වන හුණුගල් කැනීමේදි ඉවතට ගන්නා පස් ස්ථරය තුල තැන්පත්ව ඇති බර ඛණිජ ද්‍රව්‍ය ඉවත් කර ගැනීම සඳහා මිශ්‍ර ආයෝජන ව්‍යාපෘතියක් ලංකා ඛණිජ වැලි සමාගම සමග ආරම්භ කිරිමට 2020.06.20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි අනුමත වූ අතර 2020.10.13 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ලංකා ඛණිජ වැලි සමාගම සමග මිශ්‍ර ආයෝජනයක් ඇතිකරගැනීමේදි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු භූමිය ලබාදිම වෙනුවෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට ලැබියයුතු ප්‍රතිශතය 40% කොටසක් ඇතුලත්ව ගිවිසුම්ගත විය යුතු බවට තීන්දු කරන ලදී.

අමාත්‍යාංශය මගින් අප වෙත යොමු කර ඇති ලිපිය සමග අමුණා ඇති පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 2022.02.07 ලිපියේ ලංකා ඛණිජ වැලි සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා අරුවක්කාලුහි පිහිටි ඛණිජ වැලි සහිත භූමිය තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇති බව සඳහන් කර ඇත.නමුත් ඒ පිලිබඳව ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත දැන්වීමක් කර නැත.

(ඊ)ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව කන්කසනතුරේ,රුහුණු හා පුත්තලම කර්මාන්තශාලා 03 පැවතිය අතර 1993 වර්ෂයේදි රුහුණු හා පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලා පුද්ගලීකරනය කරන ලදී.කන්කසන්තරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1990 වර්ෂයේදී එවකට පැවති යුධමය තත්ත්වය හේතුවෙන් සම්පූර්ණයන්ම අකර්මන්‍ය විය.ඒ සමගම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති නිෂ්පාදන කටයුතු වලින් සම්පූර්ණයෙන්ම ඉවත් විය.වරින් වර  සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කටයුතු හා සිමෙන්ති ආනයනය කර විකිණීමේ කටයුතු වලින්ද අලාභ ලැබීම  සිදු විය.

සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා ඇසුරුම් කර්මාන්තශාලාවක් නැවත ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය වැඩ කටයුතු නව කළමණාකාරිත්වය යටතේ සිදු කිරිම ආරම්භ කල අතර ඒ සඳහා වාර්තාවන්ද සකස් කර ඇත.මූලික ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම නිසා මෙන්ම ලෝක වෙළඳපල තුල සිමෙන්ති මිල ඉහළ යාම,නැව් ගාස්තු වැඩිවිම,සීඝ්‍රයෙන් රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියඉදිරියට කරගෙන යාමෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අලාභයක් සිදුවිය හැකිය යන කරුන සැළකිල්ලට ගෙන නැවත ඇරඹීමට අපේක්ෂිතව තාවකාලිකව නවතා ඇත.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**පසුගිය වර්ෂ 04ක් සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2017-2020 දක්වා වූ වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට**

| | 2020<br>රු.'000 | පුන ප්‍රකාශිත<br>2019<br>රු.'000 | 2018<br>රු.'000 | 2017<br>රු.'000 |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 797,608 | 797,732 | 1,457 | 1,590 |
| විකිණීම සඳහා තබා ඇති වත්කම් | 750 | 750 | 796,950 | 796,950 |
| දිගුකාලීනව ලැබිය යුතු දෑ | - | - | - | - |
| ආයෝජනයන | 631,072 | 624,063 | 624,064 | 624,063 |
| මූල්‍ය වත්කම් | | 6,706 | 6,163 | 5,689 |
| | **1,429,430** | **1,429,251** | **1,428,634** | **1,428,292** |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 238 | 238 | 925 | 1,241 |
| වෙළඳහාඅනෙකුත්ලැබිය යුතු දෑ | 74,017 | 76,862 | 72,999 | 74,469 |
| මුදල් හා මුදල් සමාන දෑ | 63,521 | 26,945 | 19,868 | 9,158 |
| | **137,776** | **104,045** | **93,792** | **84,868** |
| | - | - | - | - |
| **මුළු වත්කම්** | **1,567,206** | **1,533,296** | **1,522,426** | **1,513,160** |
| | | | | |
| **හිමිකම් හා වගකීම්** | | | | |
| **හිමිකම්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 966,972 | 966,971 | 966,972 | 966,971 |
| පොදුසංචිත | 9,997 | 9,997 | 9,997 | 9,997 |
| ප්‍රත්‍යාගණන සංචිත | 738,703 | 561,203 | 561,203 | 561,203 |
| රඳවාගත් ඉපැයුම් | (276,880) | (138,865) | (181,899) | (197,585) |
| විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත | (465,956) | (465,956) | (465,956) | (465,956) |
| | **972,836** | **933,350** | **890,317** | **874,630** |
| | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| දිගුකාලීන වගකීම් | 551,126 | 560,126 | 586,126 | 492,426 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | 5,519 | 4,675 | 4,013 | 3,796 |
| | **556,645** | **564,801** | **590,139** | **496,222** |
| **ජංගම වගකීම්** | - | - | - | - |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 28,274 | 28,434 | 36,824 | 42,317 |
| පොලීගෙවියයුතු කෙටිකාලීනවගකීම් | 9,000 | 6,000 | 4,000 | 97,793 |
| උපචිත බැංකු ණය පොලී | 451 | 711 | 1,146 | 2,198 |
| | **37,725** | **35,145** | **41,970** | **142,308** |
| | | | | |
| **මුළු හිමිකම් හා වගකීම්** | **1,567,206** | **1,533,296** | **1,522,426** | **1,513,160** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**පසුගිය වර්ෂ 04ක් සඳහා වූ ආදායම් ප්‍රකාශනය**
**2017-2020 දක්වා වූ වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට**

| | 2020<br>රු.'000 | පුන ප්‍රකාශිත<br>2019<br>රු.'000 | 2018<br>රු.'000 | 2017<br>රු.'000 |
|---|---|---|---|---|
| ආදායම් | 62,306 | 63,307 | 36,065 | 49,469 |
| විකුණුම් පිරිවැය | - | (565) | (316) | (16,215) |
| **දළ ලාභය /(අලාභය)** | **62,306** | **62,742** | **35,748** | **33,254** |
| වෙනත් ආදායම් | 4,730 | 7,045 | 15,375 | 22,217 |
| බෙදාහැරීම්වියදම් | - | - | - | (272) |
| පරිපාලන වියදම් | (18,862) | (18,898) | (16,883) | (20,524) |
| මූල්‍ය වියදම් | (7,456) | (11,539) | (14,652) | (16,501) |
| **බදු පෙර ලාභය** | **40,719** | **39,350** | **19,589** | **18,174** |
| බදු පිරිවැය | (1,302) | - | (3,630) | (2,877) |
| **වර්ෂයට අදාළ ලාභය** | **39,416** | **39,350** | **15,958** | **15,297** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.